වන සම්පත් හා පරිසර අමාත්‍යාංශය
සම්පත්තාය,
රත්මලාවක්ක පාර,
බත්තරමුල්ල.
2001.03.15

අමාත්‍යාංශ වත්‍රලේඛ අංක. 05/2001

වන සංරක්ෂකයා

සියලුම දිස්ත්‍රික් ලේකම්වරු

සියලුම ප්‍රාදේශීය ලේකම්වරු

රජයට අයත් සියලුම අවශේෂ කැලෑ කළමනාකරණය හා පාලනය කිරීම සඳහා
වන සංරක්ෂකට පැවරීම.

රජයේ අවශේෂ කැලෑ කළමනාකරණය පිළිබඳ මැයෙන් යුතු මගේ අංක. 02/02/03/5041 හා 1998/07/01 දිනැති අංක. 05/98 දරණ වත්‍රලේඛය මෙයින් අවලංගු කරන අතර, වඩාත් ක්‍රියාත්මක වන පරිදි මෙම වත්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

02) දැනට ශ්‍රී ලංකාවේ පිහිටෙන ස්වාභාවික කැලෑ ප්‍රමාණය වශයෙන් ආයතනූ කුහක් මගින් පාලනය කෙරේ. එනම් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වේ. රක්ෂිත වනාන්තර, ජෛව්ක රක්ෂිත වනාන්තර හා ඇතැම් අවශේෂ කැලෑ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් පාලනය කරනු ලබන අතර, දැඩි ජීවත්ගාවික රක්ෂිත, වන උද්‍යාන, වනාන්, අභය භූමි සහ ජාතික රක්ෂිත, වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් පාලනය කෙරේ. වන සංරක්ෂණදෙපාර්තමේන්තුවට හෝ වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට මෙරින් පාලනය නොකරනු ලබන කැලෑ රජයේ අවශේෂ කැලෑ වශයෙන් ප්‍රාදේශීය ලේකම්වරුන් යටතේ පාලනය වේ.

03) දැනට දිස්ත්‍රික් ලේකම්/ප්‍රාදේශීය ලේකම් යටතේ පාලනය වන සියලුම අවශේෂ කැලෑ රාජිත වන ප්‍රතිසංස්කරණයට යටුලුව කළමනාකරණය කිරීම, වැඩි දියුණු කිරීම හා ආරක්ෂා කිරීම සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට පවරනු ලැබේ. (එසේවුවද අවශ්‍ය අවශ්‍යවලදී දිස්ත්‍රික් ලේකම්වරුන්ට/දිසාපතිවරුන්ට හා ප්‍රාදේශීය ලේකම්වරුන්ට මෙම කැලෑ වල ආරක්ෂාව සඳහා, වන ආඥාපනත යටතේ පවරා දී ඇති බලතල ක්‍රියාත්මක කිරීමට ඒන් බාධාවක් නොවේ.)

04) රජයේ අවශේෂ කැලෑ කිසියම් ප්‍රදේශයක් පරිහරණ කවිදුන්නක් සඳහා යොදා ගැනීමට අවශ්‍ය වන්නේ නම්, ඒ සම්බන්ධව වාහපෘති යෝජනාව වන වනාපත් හා පරිසර අමාත්‍යාංශයේ ලේඛනාධිකාරී දෙපාර්තමේන්තුවෙන් යුත් අත්කර් අමාත්‍යාංශ කමිටුවේ ඉදිරිපත් කළ යුතුය. ඒ සඳහා අවශ්‍ය ලිඛිත යුතු වේ. එම අනෙක්ත් අමාත්‍යාංශ කමිටුවට වන වනාපත්, ඉඩම හා වන ජීවී යන විෂයය ක්ෂේත්‍රයන්හි දැනුම අමාත්‍යාංශවල නිලධාරීන්ගෙන් සමන්විත වේ. ඉඩම්, ඉඩම් ගැනීම් සම්බන්ධියෙන් වූ ව්‍යාපෘති යෝජනාව පළමුවට දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටුවට ඉදිරිපත් කර, ඉන්පසු එම නිර්දේශය වන සංරක්ෂණ මණ්ඩලයේ නිර්දේශය සහිතව අත්කර් අමාත්‍යාංශ කමිටුවට ඉඩම යොමු කළ යුතුය. මෙම කමිටුවට මණ්ඩින් අධ්‍යක්ෂතය කරනු ලබන එම යෝජනාව අනුමත කිරීමක් නම් එම අංශක් ආකිය පාරිසරික පාකෘත ඵලයක් පරිසර ඇගැයීමකට ලක් කිරීම සඳහා එම යෝජනාව යොමුකරයි අවශ්‍ය නැවත යොමු කරනු ලැබේ. පරිසර ඇගැයීමක් අවශ්‍ය වන අවස්ථාවලදී එම පරිසර ඇගැයීම සඳහාකය යෝජනාවා විෂයක් ලබාගැනීම මට වඩාක ඉඩදිය යුතු වේ. අදාල නිර්දේශය අනුව ඉඩම ලබාදීම පිළිබඳව අනුමැතිය මා විසින් දෙනු ලබන අතර, ඉන් අනතුරුව අවස්ථාවට උචිත ඉඩදි අදාල පාර්ශවයන්ට සුදුසු සොයාබැඳි මත ඉඩම් ලබාදීම සඳහා අවශ්‍ය ඉඩම් ඉඩම් කොමසාරිස් වෙත නිදහස් කරනු ලැබේ.

05) දැනට ප්‍රකාශයට පත්කර ඇති ඝාතික වන ප්‍රතිපත්තියේ අදාලව නව නීති සෙදුම්වලත් සහාය කරන තුරු, ඉඩම සඳහාය ක්‍රියා පිළිවෙත යොදා ගනිමින් රජයේ අවශේෂ කැලෑ කළමනාකරණය කළයුතුය.

06) මෙම වත්‍රලේඛය නිකුත් කරනු ලබන්නේ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා පරිසාලන ප්‍රාන්ත්‍රීය සංවර්ධන අමාත්‍යාංශයේ නිකුතාගාවය ඇතිවය.

07) කරුණාකර මෙම වත්‍රලේඛය ලද බව දන්වනු මැනවි.

එන්. ගුණපාලදාස්,
ලේකම්,
වන සම්පත් හා පරිසර අමාත්‍යාංශය.

පිටපත් :-

1. ජනාධිපති ලේකම් } දැන ගැනීම සඳහා.
2. අග්‍රාමාත්‍ය ලේකම් } දැන ගැනීම සඳහා.
3. අමාත්‍ය මණ්ඩල ලේකම් } දැන ගැනීම සඳහා.
4. ලේකම්,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය. } දැන ගැනීම සඳහා.